# සමාජ සජීවීකරණය සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය දායකත්වයේ කාර්යසාධනය සඳහා ග්‍රාමීය ජනතාවගේ පුද්ගල මූල්‍ය සාක්ෂරතාවයෙන් වන බලපෑම සංඛ්‍යාන විද්‍යාත්මකව අධ්‍යයනය කිරීම (මිද්දෙණිය නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇසුරින්)

කේ.එන්.පී. කුමාර
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
knpkuma@gmail.com

ලෝකය තරම්ම පැරණි මෙතෙක් නොවිසඳුණු ප්‍රධාන සමාජ ආර්ථික ගැටලුවක් වශයෙන් දරිද්‍රතාවය හඳුනාගත හැකිය. මෙය නූතන සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශයේ සමාජ සජීවීකරන මූලිකාංගය මත පදනම් වූ ක්‍රියාවලියකි. ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය පිළිබඳ මෑතකාලීන ප්‍රවණතා අතර ප්‍රධාන ලක්ෂණය වන්නේ දරිද්‍රතා ප්‍රතිශතය අඛණ්ඩව පහත යාම වුවත්, වැඩිවන ජනගහනය හේතුවෙන් එහි ප්‍රමාණාත්මක අඩු වීම සිදුවන්නේ ඉතා මන්දගාමීව වේ. එබැවින් ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව පිටු දැකීමේ උපකරණ සහ මෙවලම් විධිමත් සහ විනිවිද භාවයකට ලක් කිරීම කාලීන අවශ්‍යතාවයකි. ඒ අනුව මෙම පර්යේක්ෂණය තුළින් අවධානය යොමු කරනු ලබන්නේ ග්‍රාමීය අංශයේ ක්ෂුද්‍ර මූල්‍ය සමඟ සම්බන්ධ වී සිටින දරිද්‍රතාවයෙන් පෙළෙන පිරිස ආර්ථිකමය සහ සමාජීය වශයෙන් බලගැන්වීම සඳහා විධිමත් අංශයේ රාජ්‍ය සහ වාණිජකරණය වූ ක්ෂුද්‍ර මූල්‍ය නිෂ්පාදනයන් භාවිතා කරන ග්‍රාමීය ප්‍රජාව දරිද්‍රතාවයෙන් මිදීමට සහ ජීවන මට්ටම නඟාසිටුවීම සඳහා ඔවුන්ගේ පුද්ගල මූල්‍ය සාක්ෂරතාව ප්‍රසස්ථ මූල්‍ය තීරණ ගැනීමේදී කොපමණ ප්‍රමාණයකින් තීරණාත්මක සාධකයක් වී තිබේද යන්න පිළිබඳව අධ්‍යනය කිරීමයි. අධ්‍යයන අරමුණු සඳහා ප්‍රශ්නාවලි ක්‍රමය උපයෝගී කර බසනැරඹ පරිමාණයේ දත්ත ක්ෂේත්‍ර අධ්‍යයනය මගින් ලබා ගන්නා ලදී. පුද්ගල මූල්‍ය සාක්ෂරතාවය සහ ක්ෂද්‍ර මූල්‍ය පහසුකම් භාවිතා කිරීමේ කාර්යයසාධනය සඳහා සංයුත්ත දර්ශකයන් ගොඩනගන ලදි. හම්බන්තොට දිස්ත්‍රික්කය කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 500 දරණ මිද්දෙණිය නැගෙනහිර ග්‍රාම නිලධාරී වසම අධ්‍යන ප්‍රදේශය වේ. ඡන්දහිමි නාමලේඛනය උපයෝගී කර වසමේ මුළු කුටුම්භ 532 ක් අතරින් කුටුම්භ 100 ක නියදියක් සරළ සසම්භාවී නියදීම් ක්‍රමය භාවිතා කර තෝරා ගන්නා ලදි. මූලික සහ උසස් මූල්‍ය සාක්ෂරතාවය යටතේ ක්ෂුද්‍ර මූල්‍ය කාර්යයසාධනය ඇස්තමේන්තු කිරීම සඳහා සිදු කරන ලද බහුගුණ ප්‍රතිපායන විශ්ලේෂණයේ ප්‍රතිඵල පහත පරිදි විය. මූලික මූල්‍ය සාක්ෂරතාවය සහ කාර්යයසාධනය අතර සහසම්බන්ධතා සංගුණකයේ අගය 0.669 ක් වන බැවින් එම විචල්‍යයන් අතර ධන සහසම්බන්ධතාවක් පැවතීමත්, මූලික මූල්‍ය සාක්ෂරතාවය, සහ උසස් මූල්‍ය සාක්ෂරතාවය, ක්ෂුද්‍ර මූල්‍ය කාර්යයසාධනය යන විචල්‍යය සමඟ සරල රේඛීය සම්බන්ධතාවයක් පවතීමත් නිසා බහුගුණ ප්‍රතිපායන ආදර්ශ ආකෘතිය ගොඩ නැගීමට හැකි විය. මෙම අධ්‍යනය හරහා මූලික මූල්‍ය සාක්ෂරතාවය සහ උසස් මූල්‍ය සාක්ෂරතාවය ඉහළ යන විට ක්ෂුද්‍ර මූල්‍ය උපයෝජනයේ කාර්යයසාධනය ඉහළ යන බව අනාවර්ණය කර ගැනීමට හැකි විය.

**ප්‍රමුඛපදඃ**-මූල්‍ය සාක්ෂරතාවය; ක්ෂුද්‍ර මූල්‍ය; දරිද්‍රතාවය; සමාජීය වශයෙන් බලගැන්වීම